**ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

----------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රත්නපුරදිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරවදිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම,විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්,වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන,වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර,එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්තඉදිරිපත්කිරීමඅගයනලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්,ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත්නෛතිකඅවශ්‍යතාපිළිබඳවාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මූල්‍ය ප්‍රකාශන තුළ ශීර්ෂ 278 ට අයත් නොවන සහ භාවිතා නොකරන රු.6,150,000ක වසා දමන ලද පාසල් ගොඩනැගිල්ලක් ස්ථාවර වත්කම් ලෙසගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී මේ පිළිබඳ සොයා බලා නිවැරදි කිරීම් සිදු කිරීමට සටහන් කර ගත් බව දන්වමි. | නිවැරදිව අයිතිය හඳුනා ගෙනඑම වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක කේවල මූල්‍ය ප්‍රකාශන අනුව දේපළ පිරියත හා උපකරණ (මූල්‍ය නොවන වත්කම්) වටිනාකම් එකතුව රු.2,084,793,758ක් වුවද දිස්ත්‍රික් ලේකම් විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු.2,119,331,612ක් වූයෙන්රු.34,537,854ක වෙනසක් නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක වාර්තාගත කිරීමේ දෝෂයන් මීට හේතු වී ඇත. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි නිසි ලෙස පොත් පත් සහ වාර්තා පවත්වා ගැනීමත් සන්සන්දනයක් සිදු කිරීම මඟින් නිවැරදිතාවය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් විකිණීමෙන් ලද ආදායම රු.294,710ක් වුවදඉන් රු.98,395ක් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | මේ පිළිබඳව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ඉදිරියේදී උපදෙස් දීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඉල්ලුම් කළ අග්‍රිම නොලැබුණු බැවින් වැඩසටහන් 10ක් යටතේ ශිවිසුම්ගත මුදල රු.මි 149.1 ක් වූ ව්‍යාපෘති 103කින් 102ක වැඩ අවසන් වී තිබුණද, අක් මුදල් නොමැති වීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.මි 104.5ක් එකී ව්‍යාපෘති වෙනුවෙන් ගෙවිය යුතුව තිබුණි. | ප්‍රමාණවත් අක්මුදල් නොමැතිවීම හේතුවෙන් මෙම ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමට නොහැකි වී ඇති බව. | භාණ්ඩාගාරය සමඟ සමීප සම්බන්ධතාවයකින් යුතුව අග්‍රිම කළමනාකරණය මනා ලෙස සිදුකර ගැනීමට කටයුතු කල යුතුය. |

**2.2 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020/2021 මහ කන්නයේ වී මිලදී ගැනීමට පරිපූරක ඇස්තමේන්තු මගින් ලබාදෙනු ලැබූ රු.3,000,000ක මුළු මුදලම මහා භාණ්ඩාගාරයට පියවා තිබූ අතර, 2021 වර්ෂයේ අතරමැදි කන්නයේ මුං බීජ අස්වැන්න මිලදී ගැනීම සඳහා පරිපූරක ඇස්තමේන්තු යටතේ ලද රු.54,600,000ක ප්‍රතිපාදනවලින් රු.27,701,254ක් පමණක් එනම් සියයට 50.7ක් පමණක් භාවිතා කර තිබුණි.මේ අනුව විශේෂ කටයුත්තක් වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තුවක් මගින් ප්‍රතිපාදන ලබාගෙන තිබුණදඅදාළ කාර්යයට යොදා නොගෙනරු.26,898,746ක් ඉතිරි වී තිබුණි. | මෙම වැඩසටහන රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත ක්‍රියාත්මක කරන ලද්දක් බවත්, අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අවශ්‍ය පහසුකම් නිසි පරිදි සංවිධානය කළ ද අදාළ දැනුම් දුන් ප්‍රමාණයම අලෙවි කිරීමට ගොවි මහතුන් කටයුතු නොකළ හෙයින් වෙන් කරන ලද සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණයම භාවිතා කිරීමට අවකාශ නොලැබුණි. | වර්ෂය සඳහා සැලසුම්සහගත පරිදි අරමුණු ඉටු කර ගැනීමට ලබා දී ඇති ප්‍රතිපාදන සකසුරුවම් ලෙස උපයෝජනය කළ යුතුය. |

**2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18ට වෙනත්අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 74කින් කාර්යයන් 80 ක් සඳහා ලබාදුන් රු.මිලියන 946.9ක ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයේරු. මිලියන 479.6ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එකී ඉතිරිවීම් මුළු ප්‍රතිපාදනවලින් සියයට 5 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි. | පැවති කෝවිඩ් වසංගත තත්ත්වය මත වැඩසටහන් සැලසුම් කළ පරිදි පැවැත්වීමට නොහැකි වීම, අක්මුදල් නොලැබීමආදී කරුණු මීට හේතු විය. | ව්‍යාපෘති සඳහා වෙන්කල ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳ කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා, අභ්‍යන්තර පාලන පද්ධතියක් පවතින අතර, ඒ පිළිබඳව විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වලදීද පවතින තත්ත්වය සමාලෝචනය කරනු ලබයි.තවද, එම වාර්තාවේ පිටපතක් රජයේ විගණන අංශය වෙතද ලබාදෙනු ලැබේ. ඊට අමතරව වරින්වර අභ්‍යන්තර විගණන උපදෙස් ලබා දී ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 කට අදාළව වර්ෂ 02 ක් ඉක්ම වූ රු. 37,968,871 ක් වටිනා තැන්පතු 123 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කරමින් පවති. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම කඩිනමින් සකස් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| | • 3.2 (iv) ඡේදය | කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව රු.1,485,109 ක් වටිනා ව්‍යාපෘති 03 ක් චක්‍රලේඛයට පටහැනිව උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි. | කිසිදු ව්‍යාපෘතියක් සඳහා උපකොන්ත්‍රාත් ලබාදීමට කටයුතු කර නැති බව දන්වා ඇත. | චක්‍රලේඛයේ 3.2 (iv) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>----------------------- | | | |
| (i) 2.8.1(ආ) මාර්ගෝපදේශය | මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවට විෂයය පිළිබඳව දැනුම ඇති නිලධාරියෙකු ඇතුලත් විය යුතු වුවද, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව රු.1,340,300 ක් වටිනා තාක්ෂණික උපකරණ, මහන මැෂින් හා වෙනත් යන්ත්‍ර මිලදී ගැනීම්වලදී එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මිලදී ගැනීම් සඳහා එම ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ඇති නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 3.4 වගන්තිය | ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් මිලගණන් කැඳවීම මගින් සුදුසු ලංසුකරුවෙකු තෝරා ගත යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් එකී විධිවිධානවලට පටහැනිව වාහන 10 ක සේවා කටයුතු සඳහා රු. 999,133 ක් ගෙවා තිබුණි. | උසස් තාක්ෂණයෙන් යුතු ආයතනයක් ප්‍රදේශයේ නොමැතිවීම, ඉදිරියේ දී අදාල පරිදි මිලගණන් කැඳවීම සිදු කොට සේවා කරන ලෙස නිලධාරීන් දැනුවත් කිරීම, මු.රෙ. 135 බලතල පැවරීම අනුව ප්‍රාදේශීය ලේකම්ට රු.25000 ක දක්වා අලුත්වැඩියා සඳහා බලය දීමට හැකි වීම යන කරුණු දක්වා ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) 2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයෙහි 03 ඡේදය | තම කොට්ඨාශයේ යම් විශ්‍රාමිකයකු මියගියහොත් දින 07 ක් ඇතුලත විශ්‍රාම වැටුප් අංකය සහිතව ඒ බව වහාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත වසම්භාර ග්‍රාම නිලධාරී විසින් දැනුම් දිය යුතු වුවත්, එසේ නොකිරීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් | පැවති කොරෝනා වසංගත තත්ත්වය තුළ ග්‍රාම නිලධාරීන්ට රාජකාරී අධික වීම හේතුවෙන් විශ්‍රාමිකයින්ගේ මිය යෑම් ලිඛිතව වාර්තා කිරීමට යම් කාලයක් ගත වීම, යම් විශ්‍රාමිකයකු මියගිය හොත් දින 07ක් ඇතුළත විශ්‍රාම වැටුප් අංශය දැනුවත් කරන ලෙස දන්වා ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීම් කර ඇත. | චක්‍රලේඛයෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

කාර්යාල 03 කට අදාලව මියගිය විශ්‍රාමිකයින් 15 දෙනෙකු වෙත ගෙවන ලද රු. 542,688 ක විශ්‍රාම වැටුප් මුදල් අය කර ගත යුතුව තිබුණි.

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ස්ථාන මාරුවී ගිය,විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කළ සේවකයින් 17 දෙනෙකුගෙන් අය විය යුතු රු .2,213,837ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ හා ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.7 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අදාළව කර්මාන්ත 697කින් ලබාගත් රැඳවුම් මුදල් රු.40,722,851 ක් වගකීම් කාල සීමාව ඉකුත්ව ගොස් විගණිත දිනය වූ 2022 පෙබරවාරි 25 දින වන විට මාස 01 සිට මාස 35 ක් ගත වී තිබුණද, ඒවා නිදහස් නොකර තවදුරටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රඳවාගෙන තිබුණි. | ගෙවීමට අක්මුදල් නොමැතිවීම | වගකීම් කාල සීමාව ඉකුත්ව ගොස් ඇති රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම්සමාලෝචනය

------------------------------

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------- | ----------- |
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරකම් 26 ක අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා නොවීමේ ප්‍රතිශතය සියයට 57 සිට සියයට 100 අතර පරාසයක පැවතුණි. | කොවිඩ් වසංගත තත්ත්වය මීට හේතුවූ බව දන්වා ඇත. | ඉලක්කයන් ලඟා කර ගත හැකි පරිදි සැලසුම් සකස් කළ යුතු අතර එකී ඉලක්කයන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 1995 ජුනි 15 දිනැති චක්‍රලේඛ අංක 2008/04 පරිදි 2021 දෙසැම්බර් 31 දිනට රජයේ ඉඩම් සඳහා බලපත්‍ර/ දීමනාපත්‍ර නිකුත් කිරීමේ දී,ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ඉඩම් කච්චේරි නොපැවැත්වීමත්,05ක පවත්වන ලද ඉඩම් කච්චේරි ගණන 01 සිට 06ක් තරම් අඩු පරාසයක් ගෙන තිබීමත්, 04ක් විසින් නියමානුකූල කිරීමට තිබූ ඉඩම් ප්‍රමාණය හඳුනා නොගැනීමත්, 04කට අදාළව අනවසර ඉඩම් නියමානුකූල කිරීමට ඇති ඉඩම් කැබලි සංඛ්‍යාවෙන් හඳුනා නොගැනීමත්, 02ක් විසින් කිසිදු බලපත්‍රයක් ප්‍රදානය කිරීමට කටයුතු නොකර තිබීමත් හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කය තුළ අනවසර ඉඩම් නියමානුකූල කිරීමේ ක්‍රියාවලිය මන්දගාමී ස්වරූපයක් ගෙන තිබුණි. | වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඉලක්ක ගත සංඛ්‍යාව සපුරා ගැනීමට නොහැකිවූඅතර අනවසර ඉඩම් නියමානුකූල කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරිමට අවධානය යොමු කරන බව දන්වා ඇත. | අනවසර ඉඩම් නියමානුකූල කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂා කළ ඇස්තමේන්තුගත පිරිවැය රු.11,221,410ක් වූ ව්‍යාපෘති 31ක් නිම නොකර අත්හැර දමා තිබුණි. | සිමෙන්ති හිඟය හා වෙළඳපල තුළ පැවති ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල අධික ලෙස ඉහළයාම හේතුවෙන් ගිවිසුම්ගත සමිති විසින් ඉදිකිරීම් ප්‍රතික්ෂේප කිරීම, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම,ව්‍යාපෘතිවල මූලික වැඩ ආරම්භ කලද කොන්ත්‍රාත්කරු වැඩ අවසන් කිරීම සඳහා උනන්දුවක් නොදැක්වීම ආදී වශයෙන් කරුණු මීට හේතු වූ බව දන්වා ඇත. | නියමිත කාල වකවානුව තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකි වන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටුකිරීමට කටයුතු කළ යුතු ය. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ඉකුත් වර්ෂ 04 ක සහ සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16කට අදාළව දිස්ත්‍රික්කයේ විකල්ප ඉඩම් ලබා දීමට හඳුනාගත් පවුල් සංඛ්‍යාව 2418ක් වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉන් යෝග්‍ය ඉඩම් ලබාදුන් පවුල් සංඛ්‍යාව 1362ක්වූ අතර එහි ප්‍රගතියසියයට 56ක් විය. | පුද්ගලයින් විසින් තෝරාගන්නා ලද ඉඩම් ජා.ගො.පර්.සං මගින් නිර්දේශ නොකිරීම, පරීක්ෂා කර බලා වාර්තා යොමු කරන විට එම තෝරාගත් ඉඩම් විකුණා තිබීම, යෝජනා කරන රජයේ ඉඩම්හි පදිංචි වීමට අකමැති වීම, අදාළ ලියකියවිලි ලබා දීමට පුද්ගලයින් තුල උනන්දුවක් නොමැති වීම හා පවතින නීතිමය ගැටළු ආදී කරුණු මීට හේතු විය. | දැනට අත්පත් කරගෙන ඇති ඉඩම්වල මිනින්දෝරු වාර්තා කඩිනමින් ලබාගෙන ඉඩම් ලබාදීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රත්නපුර දිස්ත්‍රික්කයේ ඉකුත් වර්ෂ 04ක සහ සමාලෝචිත වර්ෂයෙහිගංවතුරින් හා නායයාම්වලින් හානියට පත් මුළු නිවාස ගණන 23,127ක් වූ අතර ලබාදිය යුතුව තිබූ මුළු වන්දි මුදල රු.1,268,091,549ක් වුවද, 2021 දෙසැම්බර් 31 වන විට තවදුරටත් ලබාදිය යුතු මුදල රු.276,965,651ක් විය. | ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයෙන් ඉල්ලුම් කරන ප්‍රමාණයම නොලැබීම,ගෙවීම් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන හා අක් මුදල් මේ වන තෙක් ලැබී නොමැති බව, පුද්ගලයින් විසින් අසම්පූර්ණ අයදුම්පත් ලබාදීම හා අයදුම්පත් යොමු නොකිරීම ආදී කරුණු මීට හේතු විය. | අදාළ වන්දි මුදල් කඩිනමින් ගෙවීමට හැකිවන පරිදි සැලසුම් කළ යුතු ය. |

**3.4 ප්‍රසම්පාදනයන්**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක ව්‍යාපෘති 02කට අදාළව විධිමත් තාක්ෂණික ක්‍රමවේදයක් අනුගමනය කර නියමිත සම්පිණ්ඩන ශක්තිය පවතී දැයි තහවුරු කර ගැනීමකින් තොරව කොන්ක්‍රීට් මිශ්‍රණ අතුරා ඉදිකරන ලද මාර්ග 04 කට අදාළව කොන්ක්‍රීට් ඝන මීටර් 64.09($m^3$) ක් සඳහා රු.1,876,515ක්ගෙවාතිබුණි. | මාර්ග 04 සඳහා පරීක්ෂණ පවත්වා නොමැති බව දන්වා ඇත. | මාර්ග ඉදිකිරීම් සඳහා ගෙවීම් කිරීමේදී නියමිතසම්පිණ්ඩනශක්ති යපවතී දැයි යන්න තහවුරුකරගත යුතුය. |
| (ආ) | කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව ඉදිකිරීම් ව්‍යාපෘති 12ක වැඩ විෂයයන් 14ක් සඳහා රු. 221,093ක් විශේෂ ගාස්තු උප ලේඛන/ගාස්තු විශ්ලේෂණ (SSR/Rate Analysis) යටතේ ගෙවා තිබූ නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරුවරයාගේ හෝ ඉහළ තාක්ෂණික දැනුම ඇති නිලධාරියෙකු ඉදි කිරීම් නියමිත ප්‍රමිතියට සිදු කර ඇද්ද යන්න පරීක්ෂා කර අනුමත කර නොතිබුණි. | නිරීක්ෂණ හා එකඟ වන බවත්, මින් ඉදිරියට උපදෙස් පරිදි ක්‍රියා කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දීමට කටයුතු කල බවත් දන්වා ඇත. | ඉදිකිරීම් නියමිත ප්‍රමිතියට සිදු කර ඇති බවට පරීක්ෂා කර ගෙවීම් අනුමත කළ යුතුය. |
| (ඇ) | මහාමාර්ග පිළිබඳව ගාස්තු උපලේඛනය (HSR) ST 47 අනුව 1:2:4 කොන්ක්‍රීට් මිශ්‍රණයේ අවම සම්පිණ්ඩන ශක්තිය 20 $N/mm^2$ විය යුතු අතර ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළව මෙම සම්පිණ්ඩන ශක්තිය පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ලෙස හැමර් පරීක්ෂාව සිදුකර ප්‍රතිපාදන මුදල් එකතුව රු. | ඉදිරියේදී ඉටු කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් නිලධාරීන්ට උපදෙස් ලබා දීමට කටයුතු කරන බව, සහ අදාල පිරිවිතරයන් පිළිබඳව කොන්ත්‍රාත්කරුවන් නිරතුරුව දැනුවත් කර ඇති බව දන්වා ඇත. | නියමිත ප්‍රමිතියටම අනුව කටයුතු කළ බවට අධීක්ෂණය නොකිරීම සම්බන්ධයෙන් අදාල වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2,500,000ක් වූ මාර්ග 04ක් අසමත් ලෙස හඳුනාගෙන තිබුණි. මෙලෙස අසමත් වූ මාර්ග සඳහා කෝ කටර් (Core Cutter) පරීක්ෂාවක් සිදුකර තිබුණු අතර එම පරීක්ෂාව ද අසමත් වී තිබුණි. මෙම මාර්ගයන් සම්බන්ධයෙන් ද්‍රව්‍ය මැනීම සඳහා සම්මත ප්‍රමාණයේ පෙට්ටි භාවිතා නොකිරීමත්, ක්ෂේත්‍රයට ගෙනෙන ලද වැලි නියමිත ප්‍රමිතියෙන් නොමැති වීමත්, භාවිතා කළ ද්‍රව්‍යයන් ඒවායේ මූලාශ්‍ර සහිතව සටහන් කර ගැනීමට සංවර්ධන නිලධාරී / කාර්මික නිලධාරී කටයුතු කර නොතිබීමත්, පරීක්ෂණ වාර්තාව අනුව පර්යේෂණ නියැදිවල ඝනකම නියමිත ඝනකම වූ 0.15mට වඩා අඩු අගයක් පැවතීමත් නිරීක්ෂණය විය. ඒ අනුව මාර්ගයේ පිරිවිතර කෙරෙහි සමීප අධීක්ෂණයක් සිදුකර නොමැති බවත් නිරීක්ෂණය කෙරේ. | | |
| (ඇ) | කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කරපිංච රබර් පැල තවානේ භූමිය සකස් කිරීම හා ග්ලයිෆොසෙට් ගබඩා කිරීමට සුදුසු පරිදි ගොඩනැගිල්ලක් සකස් කිරීම සඳහා කැනීම් යන්ත්‍රයක් (excavator)මගින් ගස් ඉවත් කර භූමිය සකස් කිරීම වෙනුවෙන්2020 සැප්තැම්බර් 29 දින කොන්ත්‍රාත්කරුට රු.959,020ක් ගෙවා තිබුණි. 2021 නොවැම්බර් 29 දින සිදුකළ විගණන පරීක්ෂාවේදී යන්ත්‍රය භාවිතා නොකල යන්ත්‍ර මීටර් පැය 455.47ක් සඳහා රු. 783,408ක් වැඩිපුර ගෙවා තිබුණු බව නිරීක්ෂණ විය. එසේම මෙම කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 06 යටතේ දෝෂයක්ද පැවති අතර සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) විසින් ගෙවීම් නිර්දේශ නොකර ඒ වෙනුවට පරිපාලන නිලධාරී විසින් ගෙවීම් නිර්දේශ කර තිබුණි. තවද, සැපයුම්කරුගෙන් ගෙවීම් සඳහා බිල්පතක්ද ලබාගෙන නොතිබුණි. | පිළිතුරු පිළිගත නොහැකිය. 2019 ජුලි 04 සහ2020 පෙබරවාරි 24 දිනැති දිස්ත්‍රික් ඉංජිනේරුගේ ලිපිය පරිදි යන්ත්‍රය ක්ෂේත්‍රය තුල සත්‍ය වශයෙන්ම වැඩ කරන ලද යන්ත්‍ර පැය ගණන තහවුරු කරගෙන ගෙවීම් කළ යුතු බව දන්වා තිබුණද,ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රජයේ කාර්යයන් ඉටු කිරීමේදී අරපිරිමැසුම්දායීබව පිලිබඳ විශේෂිත අවධානය යොමු කරමින් කටයුතු කළ යුතුය. තවද,මුදල් රෙගුලාසි 156(i) ප්‍රකාරව ද කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ රු.2,000,000ක් බැගින්දින 68 තුල ඉදිකිරීමේ පදනම මත 2017 ඔක්තෝබර් 25 දින ගිවිසුම්ගත පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව ගල්ලින්න හා මොරතොට නිල සෙවන කාර්යාලය ඉදිකිරීම සම්බන්ධයෙන් වැඩ විෂයයන් 16 කට අදාලව රු. 567,269ක් වූ වැඩිපුර ගෙවීම් සම්බන්ධයෙන්විගණිත දිනය වූ 2022 පෙබරවාරි 02 වන විටත් පරීක්ෂණ පවත්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට කමිටුවක් පත්කර ඇති බවත්,එහි වාර්තාව ලද වහාම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් දන්වමි. | මුදල් රෙගුලාසි 156 (i) ප්‍රකාරව වැඩිපුර ගෙවීම් පිළිබඳව පරීක්ෂා කර අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | දොරින් දොරට ගමින් ගමට සංවර්ධන වැඩසටහන - 2015 යටතේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටඅයත් මැදබැද්ද සේවා පියස කාර්යාලයඉදිකරන ලද භූමියේ/ ප්‍රදේශයේ පසෙහි ස්වභාවය පිළිබඳ නිසි අවධානයකින්/ පරීක්ෂාවකින් පසුව ඊට ගැලපෙන පරිදි ගොඩනැගිල්ලේ අත්තිවාරම සඳහා සැලසුම්/ ඇස්තමේන්තු සැකසිය යුතුය. එසේ වුවද ඒ පිළිබඳව නිසි සැළකිල්ලක් නොදක්වා (අනවධානයෙන්)ගොඩනැගිල්ලේ අත්තිවාරම කළුගල් හා සිමෙන්ති පමණක් යොදාගනිමින් ඉදිකිරීම හේතුවෙන් අසාමාන්‍ය ඉරි තැලීමකට ලක් වූරු.1,279,531ක් වූ ගොඩනැගිල්ල ඉදිකිරීම් නිමකර වර්ෂ 05කට පසු කඩා ඉවත් කිරීමට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් නිර්දේශ කර තිබුණි. ඒ අනුව වැය කළ මුදල නිෂ්ක්‍රීය වියදමක් වී තිබුණි. | මේ සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර ඇති බවත්, පරීක්ෂණ වාර්තාව ලැබීමෙන් පසු ඉදිරි කටයුතු සිදුකර සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරමි. | ඉදි කිරීම් සිදු කිරීමේදී නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදු කල යුතු අතර මුදල් රෙගුලාසි 156 (1) කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (උ) | ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළව මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී රු. 4,455,579ක වියදමින් 2020 වර්ෂයේ දී තාර/කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කරන ලද මාර්ග ව්‍යාපෘති 03ක් භාවිතා කළ හැකිව තිබිය දී නැවත කාපට් කිරීම සඳහා මාර්ගය සැකසීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේ සපිරිගමක් වැඩසටහන යටතේ සංවර්ධනය කරන ලද මෙම ව්‍යාපෘති, 2021 වර්ෂයේදී ඉතිරි මාර්ග කාපට් කිරීම යටතේ සංවර්ධනය කිරීමේදීද මෙම මාර්ග කොටසද ඇතුළත්කර ඇත.ඒ සඳහා ප්‍රාදේශීය සභා කමිටුවේ අනුමැතිය ලැබී ඇති බවද දන්වමි. | රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2021 පෙබරවාරි 12 දිනැති අංක 2/2021 දරන “දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පිළිබඳ මාර්ගෝපදේශය”කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | 2017 ගංවතුර හා නායයාම් හේතුවෙන් විපතටපත් පවුල් පදිංචි කිරීමට යෝජිත ඉඩමේ මාර්ග ඉදි කිරීමට කිරිඇල්ල හා ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් රු. මිලියන 18ක් වෙන්කර තිබුණි. එම මාර්ග ඉදිකිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9 ඡේදයේ 3.9.2 යටතේ ප්‍රජාපාදක සංවිධාන වෙත සෘජු කොන්ත්‍රාත් ලබාදීම සහ 3.9.4 යටතේ ලංසු කැඳවා සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීම යන විකල්ප ක්‍රම දෙක පිළිබඳවම මාර්ගෝපදේශ ලබා දී තිබුණ ද, 3.9.4 කෙරෙහි විශේෂ අවධානය යොමුකර තරඟකාරී ප්‍රසම්පාදනයෙන් රජයට ලබාගත හැකි වාසි පිළිබඳ අවධානය යොමු නොකර අදාල කටයුතු ප්‍රජාපාදක සංවිධාන වෙතින් කර්මාන්තය කොටස් කර ඉටුකරවා ගැනීමට කටයුතු කර තිබුණි. | අධි අවදානම් ප්‍රදේශ බැවින් ප්‍රතිලාභීන් කඩිනමින් ගම්මානවල පදිංචි කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කළ යුතු බැවින් ද, වර්ෂය තුළ ක්‍රියාත්මක අනෙකුත් සංවර්ධන වැඩසටහන් සෘජු කොන්ත්‍රාත් ලබා දීම යටතේ සිදු කර ඇති බැවින් ද, ප්‍රමාණවත් කොන්ත්‍රාත්කරුවන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී නොමැති බැවින් ද, ප්‍රජා පාදක සංවිධාන වෙත සෘජු කොන්ත්‍රාත් ලබා දීමට කටයුතු කරන ලදි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.9.2 සහ 3.9.4 මාර්ගෝපදේශය අනුව රජයට වඩාත් වාසිසහගත වන අයුරින් කොන්ත්‍රාත් ප්‍රදානය කළ යුතුය. |
| (එ) | ඇස්තමේන්තු වටිනාකම රු.4,673,034 ක් වූ ඇහැලියගොඩ නැදුරන මොරපිටියවත්ත පාලම නැවත ප්‍රතිසංස්කරණය කර2021 දෙසැම්බර් 31 දින වැඩ අවසන් කළ යුතු වුවද අවස්ථා 02 කදී දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණද, 2022 අප්‍රේල් 01 දින භෞතිකව පරීක්ෂා කළ අතර එදින වන විට ද භෞතික ප්‍රගතිය සියයට 30ක් තරම් පහල මට්ටමක පැවතුණි.පාලමේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාදය හේතුවෙන් ගම්වාසීන්ට අනාරක්ෂිත තාවකාලික පාලමෙන් තම අවශ්‍යතා සපුරා ගැනීමට සිදු වී තිබුණි. | උපදේශන සේවා සැපයීමේදී මතු වූ ගැටළුකාරී තත්ත්වය, ඉදිකිරීම් භූමියේ පැවති අස්ථාවරත්වය, ඉදිකිරීම් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වෙළඳපොල තුළින් සපයාගැනීමට නොහැකි වීම මෙන්ම එම කාලය තුළ ප්‍රදේශයට අඛණ්ඩව ලැබුණු වර්ෂාව හේතුවෙන් පාලමේ ඉදිකිරීම් ප්‍රමාද විය. | සංවර්ධන ව්‍යාපෘති කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීයලේකම්කොට්ඨාශ15ක වර්ෂයක සිට වර්ෂ40 ක පමණ කාලයක් තිස්සේභාවිතයට නොගන්නා රජයේ ගොඩනැගිලි 122ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේවර්ෂයකටඅධික කාලයක් තිස්සේ භාවිතයට නොගන්නා රජයේ ගොඩනැගිලි 06ක් ඵලදායි කාර්යයකට යොදවා නොගෙන වල්බිහි වෙමින් පැවතුණි. | ඒ සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කිරීම, ගොඩනැගිලි දිරාපත් වී ඇති බැවින් ප්‍රතිසංස්කරණය කර භාවිතයට ගන්නා බව දන්වා ඇත | අදාල දේපල විධිමත් ලෙස උපයෝජනය කර ගැනීමට පියවර ගත යුතු අතර රජයේ දේපලවල ආරක්ෂාව සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

**3.6 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880හා අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2019 මාර්තු 23 දිනැති අංක 07/2019 දරන චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10ක ඇප තැබිය යුතු නිලධාරීන් 29 දෙනෙක් විසින් ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. මුදල් රෙගුලාසි 881 (ii) සඳහන් විධිවිධාන ප්‍රකාරව එලෙස ඇප තැබීමට අවශ්‍ය සිය යටත් නිලධාරීන්ගෙන් නියමිත කාල සීමාව ඇතුළත ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැන්පත් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි 880 හා 881(ii) ප්‍රකාරව ඇප තැබීමේ කටයුතු සිදු කළ යුතු ය. |

**3.7 අනාර්ථික ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන යටතේ ඉදිකිරීම් ආරම්භ කර තිබුණු නමුත් | 2019 ඔක්තෝබර් 11 දිනැති ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් මෙම ගොඩනැගිල්ල දැනට ඉදිකිරීම් සම්බන්ධයෙන් ලබාදුන් තත්ත්ව වාර්තාවක් කිසිදු ආයතනයක් | සංවර්ධන ව්‍යාපෘති නිසි සම්බන්ධීකරණයකින් සහ නිසි අධීක්ෂණයකින් යුක්තව ඵලදායීව සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ස්ලැබ් එක (Slab) පමණක් ඉදිකිරීමෙන් පසුව ඉදිකිරීම් නවතා දමා තිබුණි.<br>වර්ෂ 08 කට පසුව එනම් 2021 වර්ෂයේදී ඉතිරි වැඩ නිම කිරීම සඳහා ලැබුණු රු.26,419,500 ප්‍රතිපාදනය, ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් නොවීම, පසුවිපරම් ක්‍රියාවලිය දුර්වලවීම හා නිසි අධීක්ෂණයක් නොවීම ආදී කළමනාකරණ දුර්වලතා හේතුවෙන් ප්‍රතිපාදනය ආපසු පවරා දී තිබුණි. ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේ දී රු.3,535,723 ක පිරිවැය වූ ඉදිකිරීම් ස්ථානය සම්පූර්ණයෙන්ම වල් බිහි වී තිබීම, ඉදිකිරීම් පරිශ්‍රය තුළ විශාල ගස් වර්ධනය වී තිබීම වැනි කරුණු සැලකිල්ලට ගැනීමේදී නිෂ්කාර්යය ඵලරහිත අනාර්ථික ගනුදෙනුවක් බව විගණනයේදී නිරීක්ෂණය විය.මෙම ඉදිකිරීම වර්ෂ 11 ක් ගතවී තිබුණද නිම කර නොතිබුණි. | වෙතින් දිස්ත්‍රික් ඉංජිනේරු වෙත ලබා දී නොමැති බවට දිස්ත්‍රික් ඉංජිනේරු වාර්තාවේ දක්වා ඇති බව, අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිය සඳහා විධිමත් ඇස්තමේන්තුවක් හා ගෘහ නිර්මාණ සැලසුම් ලබාගෙන ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කලේ නම් මෙවැනි තත්ත්වයක් ඇති නොවන බව දන්වා ඇත. | |
| (ආ) | ග්‍රාමීය පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලද රු. 1,500,000ක ප්‍රතිපාදන යටතේ කුරුවිට ප්‍රාදේශීය සභාව කොස්ගල වොලිබෝල් ක්‍රීඩාංගනය සංවර්ධනය කර 2021 වර්ෂයේදී අවසන් කර තිබුණද විගණිත දිනය වූ 2022 පෙබරවාරි 25 දින දක්වාම ක්‍රීඩාපිටිය භාවිතා කර නොතිබුණි. | කුරුවිට ප්‍රාදේශීය ලේකම් විසින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර අදාළ ඡායාරූප සමඟ වාර්තා කරනමෙන් කුරුවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති වෙත දැනුම් දී ඇත. | භාවිතයට නොගැනීම සම්බන්ධයෙන් අදාල වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව කටයුතු කළ යුතු අතර ක්‍රීඩාපිටිය භාවිතා කිරීමට සුදුසු තත්ත්වයට පත්කිරීමට පියවර ගත යුතුය. |

**3.8 නොවිසඳී ඇති විගණන ඡේද**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කර රු.6,693,388 ක් වැය කර තිබුණු සංස්කෘතික මධ්‍යස්ථාන 04 ක් භාවිතයට නොගැනීම හේතුවෙන් එම වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි. මේ පිලිබඳව පසුගිය වාර්තා මඟින් පෙන්වා දුන්නද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කහවත්ත සංස්කෘතික මධ්‍යස්ථානය භූමියේ අස්ථාවරත්වය හේතුවෙන් භාවිතා නොවන අතර ඕපනායක,වැලිගෙපොල, කොලොන්න යන සංස්කෘතික මධ්‍යස්ථාන ඉදි කිරීම් කටයුතු සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කරමින් පවතින බව. | ඉතිරි වැඩ කඩිනමින් අවසන් කර අදාල මධ්‍යස්ථානය උපයෝජනය කිරීමට පියවර ගත යුතුය |

**3.9 කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගංවතුර තර්ජනයට ලක්වන ග්‍රාම සේවා වසම් සඳහා පෙර සූදානමක් වශයෙන් ලබාදී ඔරු 51 ක් අතරින් 22 ක්භාවිතයට ගත නොහැකි තත්ත්වයෙන් පැවති අතර ඒවා අලුත්වැඩියා කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම හේතුවෙන් හදිසි ආපදා තත්ත්වයකදී මෙමඟින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැකි තත්වයක් පැවතුණි. | ඔරු අගුල්වල අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ජනරාල් වෙත ලිපියක් යොමුකර ඇත. | භාවිතයට ගත නොහැකි තත්ත්වයෙන් පවතින ඔරු 22 සම්බන්ධයෙන් අවශ්‍ය විධිමත් පියවර ගත යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය 07ක ග්‍රාම නිලධාරී කාර්යාල පිහිටා ඇති රජයේ ඉඩම් කැබලි 45 ක් 2022 ජනවාරි 13 විගණිත දින වන තෙක්ම හිමිකම නිරවුල් කරගෙන ප්‍රාදේශීය ලේකම් භාරයට ගැනීමට කටයුතු සිදුකර නොතිබුණි. | ඉදිරියේදී නිත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කරමින් සිටින බව. | රජයේ ඉඩම්වල අයිතිය විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ග්‍රාමීය කාන්තාවන් ආදායම් උත්පාදන මාර්ගවලට යොමු කිරීම හා ආදායම් උත්පාදන මාර්ගවල යෙදී සිටින කාන්තාවන් දිරිමත් කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06ක චක්‍රීය ණය වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණි.මේ යටතේ ලබාගත් ණය වාරික 10 කින් ගෙවියයුතු වුවද ණයලාභීන් 97 දෙනෙකු ලබාගත් ණය මුදලින් එකතුව රු. 485,590ක මුදලක් මාස 05සිට මාස 141 දක්වා අතර කාලයක සිට හිඟව පැවතුණි. | ණය අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | චක්‍රීය ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ උපදෙස් මාලාවඅනුව ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර නොගෙවීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. තිරසාර සංවර්ධනය

----------------------

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

---------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසිදු අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීමක් හා ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කිරීමක් සිදුකර නොතිබුණි. මේ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයන්හි විගණන වාර්තා මගින් පෙන්වා දී ඇති නමුත් ඒ පිළිබඳව විගණිත දිනය වූ 2022 මාර්තු 25 වන විටත් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මේසම්බන්ධයෙන් අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම පිළිබඳව කිසිදු උපදේශයක් අමාත්‍යාංශ මට්ටමෙන් හෝ තිරසාර සංවර්ධන සභාව මගින් අප වෙත ලබා දී නොමැත.කෙසේ වුවද, මේ සම්බන්ධයෙන්ප්‍රාදේශීයලේකම්වරුන් හා අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**5. යහපාලනය**

---------------

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2008හි 1.4 මාර්ගෝපදේශය ප්‍රකාරව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියේ සේවා යාවත්කාලීන කිරීම, පසු විපරම සහ ඇගයීම හා වැඩිදියුණු කිරීම සිදු කල යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල03ක 2014 වර්ෂයෙන් පසුව යාවත්කාලීන කර නොතිබුණි. | කඩිනමින් මෙම කටයුතු අවසන් කිරීමට කටයුතු කරමි. | 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2008හි 1.4 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**6. මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18ට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව හා තත්‍ය සේවක සංඛ්‍යාව සමග සැසඳීමේ දී පුරප්පාඩු සේවක සංඛ්‍යාව 172 ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 117ක් වූ අතර, ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරු 08ක, සහකාර අධ්‍යක්ෂක ක්‍රම සම්පාදන තනතුරු 08ක, කාර්මික නිලධාරී තනතුරු 19ක සහ ග්‍රාම නිලධාරී තනතුරු 85ක පුරප්පාඩුව පැවතීම ප්‍රාදේශීය පරිපාලනයට සහ සංවර්ධන කටයුතුවලට අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය විය.තවද අතිරික්තව සේවකයන් 117 ක් වූ අතර ඔවුන් සේවා අවශ්‍යතාවය හඳුනාගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත තබා ගැනීමට හා අනෙකුත් අය මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම පුරප්පාඩුව සම්පූර්ණ කරන තෙක් වැඩ බැලීමේ පදනම හෝ රාජකාරී ආවරණය කිරීම මගින් අදාළ රාජකාරී කටයුතු ඉටු කරවා ගැනීමට කටයුතු කර ඇත.පුරප්පාඩු හා අතිරික්ත පිළිබඳ තොරතුරු, කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම මගින් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත හා රාජ්‍ය සේවා, පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව, බඳවාගැනීම් සිදු කරනු ලබන්නේ අදාළ අමාත්‍යාංශය මගින් බව. | තනතුරුවල පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව අදාල තනතුරු අනුමත කරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |